ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය - **2021**

----------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

---------------

### 1.1 තත්ත්වාගණනය කළ මතය

--------------------------------

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව හා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107 (5) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

----------------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

------------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය විශ්වවිද්‍යාලය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විශ්වවිද්‍යාලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ. පොදු ලෙජරය, ජර්නලය, ජර්නල් වවුචර්, ගෙවීම් වවුචර් ආදී ප්‍රධාන ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන යාම සම්බන්ධ විගණන නිරීක්ෂණ පහත සඳහන් මාතෘකා යටතේ ඇතුළත් කර ඇත.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 69 ඡේදය ප්‍රකාරව පාවිච්චි කිරීම සඳහා සූදානම් තත්ත්වයට පත් වූ දින සිට ක්ෂය කිරීම ආරම්භ කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළදී පරිත්‍යාග ලෙස ලැබී තිබුණු තක්සේරු වටිනාකම රු.40,885,182 ක් වූ ජංගම නොවන වත්කම් සඳහා නියමිත කාලය සඳහා ක්ෂය ගණනය කර ගිණුම් ගත කර නොතිබුණි. | පරිත්‍යාග කරන ලද දිනට / පාවිච්චි කිරීම සඳහා සූදානම් වූ දිනට භාණ්ඩ ලැබීමේ පත්‍ර නිකුත් කිරීම ප්‍රායෝගික කළ නොහැකි වේ. කෙසේ නමුත් එම භාණ්ඩ පරිත්‍යාග ලෙස ලද වර්ෂයේම ඊට අදාළ ක්ෂය ප්‍රතිශතයක් යටතේ නිවැරදිව ක්ෂය ගිණුම්ගත කර ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කල යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) සමාලෝචිත වර්ෂය තුළදී විශ්වවිද්‍යාලයට ලැබී තිබුණු රු. 949,000,000 ක ප්‍රාග්ධන ප්‍රදාන සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 11 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගැනීම හා මැනීම සිදුකර නොතිබුණි. | පිළිතුරු ලබා දී නැත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කල යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2018 නොවැම්බර් මාසයේ වැඩ නිම කර තිබුණු ගොඩනැගිල්ලක් වෙනුවෙන් කොන්ත්‍රාත්කරු වෙත සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණු රු.2,100,434 ක් හා ඉකුත් වර්ෂවලදී ගෙවා තිබුණු රු.29,694,931 ක් ප්‍රාග්ධන ගත නොකර ඒ වෙනුවට ඒ ඒ වර්ෂයේ වියදම් ලෙස සලකා ගිණුම්ගත කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු.2,100,434 කින්, රඳවාගත් ඉපැයුම් රු.29,694,931 කින් හා 2021 දෙසැම්බර් 31 දිනට ගොඩනැගිලි පිරිවැය රු.31,795,365 කින් අඩුවෙන් දැක්වේ. තවද එම ගොඩනැගිල්ල වෙනුවෙන් සමාලෝචිත වර්ෂයට අදාළ රු.1,589,768 ක ක්ෂය හා ඉකුත් වර්ෂවලට අදාළ රු.3,362,468 ක ක්ෂය ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය රු.1,589,768 කින් හා රඳවාගත් ඉපැයුම් රු.3,362,468 කින් වැඩියෙන් දැක්වේ. | ව්‍යාපෘතිය ආරම්භ කර ඇත්තේ ප්‍රතිසංස්කරණ හා පුනරුත්තාපන ව්‍යාපෘතියක් ලෙස වන අතර ඒ අනුව මෙම ව්‍යාපෘතිය ප්‍රතිසංස්කරණ හා පුනරුත්තාපන ඉදිකිරීම් යටතේ ගිණුම්ගත කර ඇත. කෙසේ වුවත් මෙම වියදම් තාක්ෂණික කමිටුවක නිර්දේශ මත ප්‍රාග්ධනිත කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | ගොඩනැගිලි ඉදිකිරීමේ වියදම් ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) 2018 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළදී ගොඩනැගිලි 03 ක ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් වැය කර තිබුණු රු.29,118,440 ක් කෙරීගෙන යන වැඩ ලෙස හඳුනාගැනීම වෙනුවට ඒ ඒ වර්ෂයේ වියදම් ලෙස ගිණුම් ගත කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු.8,464,440 කින්, රඳවාගත් ඉපයුම් රු.20,654,000 කින් හා කෙරීගෙන යන වැඩ වටිනාකම | ව්‍යාපෘතිය ආරම්භ කර ඇත්තේ ප්‍රතිසංස්කරණ හා පුනරුත්තාපන ව්‍යාපෘතියක් ලෙස වන අතර මෙම ව්‍යාපෘතිය ප්‍රතිසංස්කරණ හා පුනරුත්තාපන ඉදිකිරීම් යටතේ ගිණුම්ගත කර ඇත. කෙසේ වුවත් මෙම වියදම් තාක්ෂණික කමිටුවක නිර්දේශ මත ප්‍රාග්ධනිත කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | ගොඩනැගිලි ඉදිකිරීමේ වියදම් ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| රු.29,118,440 කින් අඩුවෙන් දැක්වේ. | | |
| (ඇ) සුභසාධක ගොඩනැගිල්ල වැඩිදියුණු කිරීම සඳහා ගෙවා තිබුණු රු.2,479,747 ක් කෙරීගෙන යන වැඩ ගිණුමට හර කිරීම වෙනුවට ගොඩනැගිලි පුනරුත්තාපන හා වැඩිදියුණු කිරීමේ වියදම් ගිණුමට දෙවරක් හර කර කෙරීගෙන යන වැඩ ගිණුමට බැර කර තිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය හා කෙරීගෙන යන වැඩ ගිණුම රු.4,959,494 ක් අඩුවෙන් දැක්වේ. | ජ'නලය වැරදි ලෙස සටහන් කර තිබූ අතර එය නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | වියදම් නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) සමාලෝචිත වර්ෂය තුළදී ලැබී තිබුණු රු.2,000,800 ක් වූ ආදායමක්, වර්ෂයේ ආදායමක් ලෙස සලකා ගිණුම් ගත නොකර හඳුනානොගත් ආදායමක් ලෙස ජංගම වගකීම් යටතේ දක්වා තිබීම හේතුවෙන් ඊට සමාන අගයකින් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය හා ජංගම වගකීම් පිළිවෙලින් අඩුවෙන් හා වැඩියෙන් දක්වා තිබුණි. | අදාල ආදායම් නිශ්චිතව හඳුනා ගන්නා තෙක් වගකීමක් ලෙස දක්වා ඇති අතර අදාල තහවුරුවීම් ලබාගත් පසු ආදායම් ලෙස හෝ විලම්භිත ආදායම් ලෙස ගිණුම්ගත කරනු ලැබේ. | වර්ෂයට අදාල ආදායම් නිවැරදිව හඳුනා ගෙන ගිණුම් ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) 2020 වර්ෂය තුළදී විශ්වවිද්‍යාලය වෙත ලැබී තිබුණු රු.1,867,110 ක් වූ ලැබීම් ආදායමට හඳුනාගැනීමට කටයුතු නොකර ජංගම වගකීම් යටතේ උපචිත වියදම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබීම හේතුවෙන් රඳවාගත් ඉපැයීම් හා ජංගම වගකීම් ඊට සමාන අගයකින් පිළිවෙලින් අඩුවෙන් හා වැඩියෙන් දැක්වේ. | ආදායම හඳුනා ගැනීම සඳහා ප්‍රමාණවත් තොරතුරු නොමැති වූ මුදල් ලැබීම වේ. අදාල සාක්ෂි ලේඛන ලැබීමත් සමඟ ආදායම් ලෙස හෝ විලම්භිත ආදායම් ලෙස හඳුනා ගැනේ. | වර්ෂයට අදාල ලැබීම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) බලපත්‍රයේ වලංගු කාලය වර්ෂ 03 ඉක්මවා තිබුණු හා සමාලෝචිත වර්ෂය තුළදී භාවිතයෙන් ඉවත් කර තිබුණු පිරිවැය රු.7,627,908 ක් වූ පරිගණක මෘදුකාංග 02 ක් වර්ෂ 03 ක් තුළදී ක්ෂය කර අවසන් කළ යුතු නමුත්, විශ්වවිද්‍යාලය අනුගමනය කරන ක්ෂය ප්‍රතිපත්තිය අනුව ඵලදායී ජීව කාලය වසර 5 ක් ලෙස සලකා ක්ෂය කර තිබීම හේතුවෙන් ඇතිවී තිබුණු රු.2,539,086 ක හානිකරණ අලාභය හේතුවෙන් වර්ෂයේ අතිරික්තය ඊට සමාන අගයකින් අඩුවෙන් දැක්වේ. | බලපත්‍ර වලංගු කාලය වසර 03ක් වුවද විශ්වවිද්‍යාල ක්ෂය ප්‍රතිපත්තියට අනුව වසර 05 කට ක්ෂය කර ඇත්තේ අදාළ මෘදුකාංගය අවශ්‍යතාවය මත යාවත්කාලීන කිරීමේ බලාපොරොත්තුවෙනි. | මෘදුකාංගවල ඵලදායී ජීව කාලය සැලකිල්ලට ගෙන ක්ෂය කළ යුතුය. |

| | | |
|---|---|---|
| (උ) නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා පැරණි ගොඩනැගිල්ලක කොටසක් 2018 වර්ෂයේදී ඉවත් කර තිබුණු නමුත් ඉවත් කර තිබුණු ගොඩනැගිලි කොටසේ ධාරණ අගය පොත්වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම ගොඩනැගිල්ලේ ශුද්ධ අගය 2018 වසරේද ඉවත්කර නොතිබුණද, 2021 වසරේදී ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය සිදුකර පවතින ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය මත දක්වා ඇත. | කඩා ඉවත් කළ ගොඩනැගිලි කොටසේ ධාරණ අගය පොත්වලින් ඉවත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඌ) 2021 දෙසැම්බර් 31 දින වන විට මුදල් ගෙවා නොතිබුණු නමුත් එදින වන විට රසායනාගාර වෙත ලැබී තිබුණු පිරිවැය රු.5,180,521 ක් වූ රසායන ද්‍රව්‍ය තොගය ගිණුම්ගත කර නොතිබුණි. | මෙම රසායන ද්‍රව්‍ය තොග ඇනවුම් සම්පූර්ණ වී නොමැති බැවින් උපචිත ලෙස දක්වා නොමැත. | විශ්වවිද්‍යාලය වෙත ලැබී තිබූ රසායන ද්‍රව්‍ය තොගය ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කටයුතු සඳහා විදේශගතවී තිබුණු අධ්‍යයන කාර්ය මණ්ඩලයේ 35 දෙනෙකු හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ 06 දෙනෙකු නැවත සේවයට වාර්තා නොකිරීම හේතුවෙන් බැඳුම්කර කඩවීම මත 2021 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.117,355,212 ක් අයකර ගැනීමට ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි. | 2021.12.31 දිනට බැඳුම්කර එකතුව රු.117,355,212 ක් විශ්වවිද්‍යාලයට අයවිය යුතුව පැවතුණි. | විශ්වවිද්‍යාලයට අයවිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.6.2 අත්තිකාරම්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වැඩ තහනම් කිරීම , සේවයෙන් ඉවත් කිරීම හා වෙනත් හේතූන් නිසා සේවය අවසන් කළ නිලධාරීන් 16 දෙනෙකුගෙන් අයවීමට ඇති එකතුව රු. 1,132,167 ක් අයකර ගැනීමට හෝ පොත්වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | 2021 වර්ෂය තුළදී නිලධාරීන් දෙදෙනෙකුගේ අර්ථසාධක අරමුදල් නිදහස් කිරීමේදී රු. 196,925 මුදලක් අයකරගෙන ඇත. ඉතිරි නිලධාරීන්ගේ අර්ථසාධක අරමුදල් නිදහස් කිරීමේදී මෙම ණය මුදල පියවා ගැනීමට කටයුතු කරනු ලැබේ. | ණය ශේෂ අයකර ගැනීමට හෝ පොත්වලින් ඉවත් කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මුදල් රෙගුලාසි 394(ඇ) | එකතු වටිනාකම රු.1,226,544 ක් වූ අවලංගු වූ චෙක්පත් 19 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | චෙක්පත් අවලංගු කිරීමේ ලෙජරයට මාරු කර ඇත. වසර තුනක් ඉක්මවා ගිය පසු මෙම අවලංගු චෙක්පත් වල වටිනාකම් ආදායමට ගැනීමට කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. |
| (ii) මුදල් රෙගුලාසි 571 (2) | 2013 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අදාළ කොන්ත්‍රාත් වැඩ 81 ක එකතුව රු.66,552,132 ක් වූ රැඳවුම් මුදල් හා වර්ෂ 02 ඉක්මවූ එකතුව රු.1,275,175 ක් වූ ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු 88 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | 2021/10/04 දින මුදල් අංශය මගින් අදාළ අංශයන් වෙත ලිපියක් මඟින් මේ පිළිබඳ දැනුවත් කර ඇති අතර 2021/11/30 දිනට පෙර අදාළ රැඳවුම් මුදල් ප්‍රමාණ නිදහස් කරන ලෙස එම අංශයන් දැනුවත් කරන ලදී. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. |
| (iii) මුදල් රෙගුලාසි 762 | යළි ඇණවුම් මට්ටමක් පවත්වා නොගැනීම හා අනවශ්‍ය ලෙස භාණ්ඩ ඇණවුම් කිරීම නිසා වසර 30 කට වැඩි කාලයක සිට පැවත එන රසායන ද්‍රව්‍ය අධික තොග ගබඩාවේ පැවතුණි. | තාක්ෂණ කමිටුවේ නිර්දේශ මත කල් ඉකුත් වී ඇති රසායන ද්‍රව්‍ය ඉවත් කිරීමට කටයුතු කරනු ලබයි. අවශ්‍ය ප්‍රමාණයට වඩා අධික තොග තබා නොගැනීමටත්, යළි ඇණවුම් මට්ටමක් පවත්වා ගැනීමටත් අධ්‍යයනාංශ වෙත උපදෙස් ලබාදී ඇත. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වන ආයතන සංග්‍රහය 111 පරිච්ඡේදයේ 9 වන වගන්තිය හා 10.3 වගන්තිය | කොන්ත්‍රාත් පදනම මත පත්වීම් ලබා තිබුණු අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 05 දෙනෙකුගේ කොන්ත්‍රාත් කාලය ආයතන සංග්‍රහයේ විධිවිධානවලට පටහැනිව වසර 01 සිට වසර 05 දක්වා කාලයකට අදාළවන පරිදි පෙරදාතම් කර තිබුණි. | මූලික අධ්‍යාපන සම්පූර්ණ කරන ලද අයදුම්කරුවන් මූලිකව කොන්ත්‍රාත් පදනමට බඳවාගෙන පසුව කාර්යසාධනය සතුටුදායක නම් පෙරදාතම් කොට පත්වීම් ලබාදීම සිදුකල අවස්ථා පැවති නමුත් මෙම ක්‍රියාදාමය දැනට අත්හිටුවා ඇත. | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 234,117,456 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිවිරුද්ධ ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 146,550,951 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 380,668,407 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට රජයේ ප්‍රදාන වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නිසි ශක්‍යතා අධ්‍යයනයක් සිදු කර ව්‍යාපෘතිය කරගෙන යාමේ හැකියාව නිශ්චය කිරීමකින් තොරව ශ්‍රවනාගාරය ඉදිකිරීමට අදාළ කාර්යය වෙනුවෙන් උපදේශන ගාස්තු හා සැලසුම් සකස් කිරීම වෙනුවෙන් 2016 ජුනි 22 දින රු. 5,794,676 ක මුදලක් වැය කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය දක්වා එම කාර්යය ඉටු නොකිරීම හේතුවෙන් දරන ලද වියදම අනාර්ථික ගනුදෙනුවක් වී තිබුණි. | අමාත්‍ය මණ්ඩල තීරණ අනුව සැලසුම් සකස් කිරීම මෙහි පළමු පියවර වන අතර සැලසුම් සකස් නොකලේ නම් අමාත්‍ය මණ්ඩල තීරණ කඩකිරීමක් වන බවද සැලසුම් සකස් කර උපදේශන සේවා ආයතනයට ගෙවීම් සිදුකරන බැවින් මෙය අනාර්ථික වියදමක් නොවන බවත් ආර්ථික වියදමක් ලෙස දැක්විය හැක. | නිසි ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර ව්‍යාපෘති ආරම්භ කළ යුතු අතර අවම පිරිවැයක් යටතේ ව්‍යාපෘතිය නිම කිරීම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමුකළ යුතුය. |

**3.2** **කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) වෛද්‍ය පීඨය සඳහා මෙත්සෙවන ඉඩමෙන් අක්කර 6.5 ක බිම් ප්‍රමාණයක් අදියර 3 ක් යටතේ පවරා ගැනීම සඳහා 1994 ජුනි 29 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි 1998 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා එකතුව රු.මිලියන 74 ක් බස්නාහිර පළාත් සභාවට ගෙවා තිබුණි. තවත් ඉඩම් කට්ටි 03 ක් අත්පත් කරගැනීම සඳහා 2013 ඔක්තෝබර් 09 දින එම ඉඩම්වල වටිනාකමින් සියයට 25 ක් වූ රු.මිලියන 2.5 ක් මහරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ගෙවා තිබුණි. නමුත් එම ඉඩම් පවරා ගැනීමේ කටයුතු 2021 දෙසැම්බර් 31 දින වන විටත් නිමකර නොතිබුණි. | 2022.04.07 දින පලාත් ප්‍රධාන ලේකම් සමඟ සිදු කරන ලද සාකච්ඡාවෙන් පසු මෙත් සෙවන භූමිය හිමි සමාජ සේවා දෙපාර්තමේන්තුවෙන් විශ්වවිද්‍යාලය වෙත පවරා දීමට එකඟ විය.<br>ඉඩමේ හිමිකරු මෙම ඉඩමේ තක්සේරුව පිළිබඳව තෘප්තිමත් නොවීම මත 2016 වසරේ ඉඩම් වන්දි පිළිබඳව අභියාචන මණ්ඩලයට ඉල්ලුම්පතක් යොමු කර ඇත. එකී විමර්ශන කටයුතු සිදු කරන අතර එකී කාර්යය අවසන් වනතුරු ප්‍රාදේශීය ලේකම්ට ඉඩමේ භුක්තිය මිස අයිතිය පැවරීමට නොහැකිය. 2022 ජනවාරි මාසයේ සිට මෙම අභියාචනය මේ වන විට දින 04ක් කැඳවා ඇති අතර තවමත් එහි විභාගය අවසන්ව තීරණයක් ලැබී නොමැත. | ඉඩම පවරා ගැනීමේ කටයුතු කඩිනම් කළ යුතුය. |
| (ආ) 2013 වර්ෂයේ සිට අත්පත් කරගැනීමේ කටයුතු ආරම්භ කර තිබුණු තක්සේරු වටිනාකම රු. මිලියන 52 ක් වූ බොරලැස්ගමුව ඉඩම සඳහා රු. මිලියන 13 ක් 2018 වර්ෂයේදී කැස්බෑව ප්‍රාදේශීය ලේකම් වෙත ගෙවා තිබුණද එම කටයුතු 2022 ජනවාරි 31 දින වන විටත් අවසන් කර නොතිබුණි. | 2017.08.08 දින මුදල් කමිටුව තීරණය අනුව මිලියන 52 ක තක්සේරු වටිනාකමෙන් 25%ක මුදලක් කැස්බෑව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2020.08.20 දින තැන්පත් කර, අදාළ රිසිට්පත සමග ලේඛන 2020.08.21 දිනැතිව උසස් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත යොමු කරන ලදී. විශ්වවිද්‍යාලය සඳහා මූලධන ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් ගෙවීම ප්‍රමාද වී ඇත. | ඉඩම අත්පත් කර ගැනීමේ කටයුතු කඩිනමින් කළ යුතුය. |
| (ඇ) 2019 අයවැය යෝජනා තුළ ඇතුළත්ව තිබුණු හා 2021 වර්ෂයේදී නිම කිරීමට සැලසුම් කර තිබුණු අසාත්මිකතා ප්‍රතිශක්ති විද්‍යා හා සෛල ජීව විද්‍යා ඒකකය ස්ථාපිත කර නොතිබියදී ඒ සඳහා අවශ්‍ය වන පිරිවැය රු.376,244,974 ක් වූ වෛද්‍ය උපකරණ 2020 හා 2021 වර්ෂවලදී මිලදීගෙන තිබුණි. එම උපකරණ වෛද්‍ය පීඨයේ තැනින් තැන ස්ථානගත කර තිබුණු අතර අසාත්මිකතා ප්‍රතිශක්ති විද්‍යා හා සෛල ජීව විද්‍යා ඒකකය ස්ථාපිත කිරීමේ කාර්යය ප්‍රමාදවී තිබුණි. | අයවැය යෝජනා අනුව 2021 වර්ෂයේදී උපකරණ ලබා දී තිබුණද ස්ථානගත කිරීමට අවශ්‍ය ඉඩ පහසුකම් නොතිබු බැවින් මහල් කීපයක ස්ථානගත කර ඇත. එහෙත් එම උපකරණ අවශ්‍ය පර්යේෂණ කටයුතු සඳහා භාවිතයට ගනු ලැබේ. | මිලදී ගෙන ඇති උපකරණ ආරක්ෂිත ක්‍රමවේදයක් සහිතව උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඈ) 2018 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදයට අදාළ මහපොල ශිෂ්‍යත්ව හා ශිෂ්‍යාධාර වෙනුවෙන් ලැබී තිබුණු රු. 1,608,200 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | 2018, 2019, 2020 වසර සඳහා මහපොළ ශිෂ්‍යාධාර මුදල් ගෙවූ නමුත් සිසුන්ගේ බැංකු ගිණුම් අංකයන්හි පැවතුන ගැටළු නිසා බැංකුව වෙත නැවත බැර වී ඇත. | මහපොල ශිෂ්‍යත්ව හා ශිෂ්‍යාධාර මුදල් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) විශ්වවිද්‍යාලය විසින් කොම්පොස්ට් පොහොර සැකසීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීමට වර්ෂ ගණනාවක සිට සැලසුම් කර තිබුණද එය සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම ආරම්භ කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් විශ්වවිද්‍යාලයේ ඝන හා ද්‍රව අපද්‍රව්‍ය ඉවත් කිරීම වෙනුවෙන් පසුගිය වර්ෂයේ ආසන්න වශයෙන් වැය කරන ලද රු. ලක්ෂ 25 ක මුදල හා උද්‍යාන නඩත්තු කිරීමට වර්ෂයකට පොහොර හා කෘෂි රසායන වෙනුවෙන් වැය වන රු. 4,044,000 ක මුදල අඩු කර ගැනීමට නොහැකි වී තිබුණි. | කොම්පෝස්ට් සෑදීම සඳහා සුදුසු ස්ථානයක් වෙන් කිරීමේ ගැටළු පවතී. විද්‍යා පීඨයේ Center for sustainability සමඟ සම්බන්ධවී අපද්‍රව්‍ය කළමනාකරණ වැඩ සටහනක් ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට නියමිතය. | අපද්‍රව්‍ය කළමනාකරණ වැඩ සටහන ක්‍රියාත්මක කර පිරිවැය අඩුකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) අධ්‍යයන අංශ 3 ක රසායන ද්‍රව්‍ය ඇණවුම් කිරීමේදී ඒවා ලැබීමේ ප්‍රමාදයන් මාස 3 සිට අවුරුදු 01 දක්වා කාලයක් වූ අතර උක්ත අධ්‍යයන අංශ විසින් 2018 සිට 2021 වර්ෂය දක්වා ඇණවුම් කරන ලද එහෙත් 2021 දෙසැම්බර් 31 දින දක්වා රු.2,019,641 ක වටිනාකමැති රසායන ද්‍රව්‍ය අදාල අංශ වෙත ලැබී නොතිබුණි. | රසායන ද්‍රව්‍ය සඳහා මිලදී ගැනීමේ ඇණවුම් නිකුත් කලද අදාල ඇණවුම සම්පූර්ණ කිරීමට බොහෝ කාලයක් ගනු ලබන අතර කොරෝනා වසංගතය හේතුවෙන් මෙම රසායන ද්‍රව්‍ය ලැබීම තවත් ප්‍රමාද විය. | ඇණවුම් කරන ලද ද්‍රව්‍ය නියමිත දිනට ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (උ)අවශ්‍යතාවය නිසි පරිදි හඳුනාගැනීමකින් තොරව මිලදී ගැනීම හේතුවෙන් චලනය නොවන අයිතම 456 ක තොග වටිනාකම රු. 9,478,874 ක් වූ අතර සෙමින් චලනය වන අයිතම 171 ක තොග වටිනාකම රු 5,467,114 ක් විය. | විශ්වවිද්‍යාල අධ්‍යයන කටයුතු සඳහා පහසුකම් සැපයීමේදී ඉතා ඉක්මනින් අලුත්වැඩියා කිරීම අවශ්‍ය වන බැවින් නඩත්තු අයිතම තොගයන් පවත්වා ගනු ලබයි. මෙම තොගයන් පරීක්ෂා කිරීමට තාක්ෂණික කමිටුවක් පත්කර ඇති අතර නිර්දේශ මත තොගය ගැලපීමට කටයුතු කරනු ලැබේ. | අවශ්‍යතාව නිසි පරිදි හඳුනාගෙන මිලදී ගැනීම් සිදු කළ යුතුය. |
| (ඌ) සමාලෝචිත වර්ෂය අවසානය දක්වා වර්ෂ 06 ක කාල සීමාවක් තුල විශ්වවිද්‍යාලයේ කථිකාචාර්යවරුන් 453 දෙනෙකු සඳහා | කොරෝනා වසංගත තත්වය හේතුවෙන් පර්යේෂණ කටයුතු පවත්වා ගැනීමට බාධා පැවතුණු අතර පර්යේෂණයන්හි ප්‍රගතිය පිලිබඳ විශ්වවිද්‍යාලීය පර්යේෂණ කමිටුව | නියමිත කාල සීමාව තුළ පර්යේෂණ නිම කිරීමට කටයුතු කළ යුතුය. |

| | |
|---|---|
| ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 868 ක් වූ විවිධ පර්යේෂණ 459 ක් වෙනුවෙන් පර්යේෂණ හා ප්‍රකාශන කමිටුවේ අනුමැතිය ලබා දී තිබුණි. ඉන් ඉවත් කර ගැනීම් හා මුදල් ලබා නොගැනීම මත පර්යේෂණ 34 ක් නවතා දමා තිබූ අතර එකතුව රු. මිලියන 454.3 ක් වූ පර්යේෂණ 193 ක් සමාලෝචිත වර්ෂය අවසාන වනවිට සම්පූර්ණ කර නොතිබුණි. | විසින් අධීක්ෂණය කරනු ලබන අතර ඒ අනුව නිර්දේශ ඉදිරිපත් කිරීම සිදුකරයි. මෙසේ ප්‍රගතිය නොමැති සහ සම්පූර්ණ කර නොමැති පර්යේෂණ සඳහා සිහිකැඳවීම් යොමු කර ඇති අතර නව පර්යේෂණ ආධාර ඔවුන් මත නිකුත් කිරීම නවතා ඇත. |

### 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 වර්ෂයේදී බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ පාඨමාලා, සම්මන්ත්‍රණ හා විභාග පැවැත්වීම සඳහා රු.115,225,177 ක් සිසුන්ගෙන් අයකර තිබුණු නමුත් එම කාර්යයන් ඉටුකර නොතිබුණි. | පාඨමාලා ගාස්තු ලබා ගැනීමේදී ඉදිරි වර්ෂ සඳහා ද මුදල් ලබා ගන්න අතර එම ප්‍රමාණයන් අවශ්‍ය දේශනා පවත්වන තුරු විලම්භිත ආදායම් ලෙස හඳුනා ගැනේ. | සම්මන්ත්‍රණ හා විභාග පැවැත්වීම නියමිත කාලය තුළදී පැවැත්විය යුතුය. |

### 3.4 අරමුදල් ඌන උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් කොවිඩ් සම්බන්ධ පර්යේෂණ වෙනුවෙන් 2020 හා 2021 වර්ෂයන්හිදී විශ්වවිද්‍යාලය වෙත ලබාදී තිබුණු පිළිවෙලින් රු.6,174,500 ක සහ රු.29,368,398 ක මුදලින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට ඉතිරිවී තිබුණු රු.27,855,947 ක් උපයෝජනය කිරීමට කටයුතු කර නොතිබුණි. | ගිවිසුමට අනුව 2021.11.30 දින නිම කිරීමට සටහන් කර තිබුණද රටේ පැවති තත්ත්වය මත එය ආරම්භ වූයේ අගෝස්තු මාසයේදීය. එම ව්‍යාපෘතිය 2022 ජූනි දක්වා දීර්ඝ කර ඇත. | මුදල් අදාළ කාර්යය සඳහා උපයෝජනය කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) 2021 දෙසැම්බර් 31 දින වන විට ත්‍යාග හා ශිෂ්‍යත්ව අරමුදල් 82 ක් යටතේ පැවති රු.31,609,427 ක් අදාළ අරමුණු වෙනුවෙන් උපයෝජනය කර නොතිබුණි. | මෙම ශිෂ්‍යත්ව අරමුදල්හි පවතින සමුච්චිත ශේෂයන් පිළිබඳව වාර්ෂික උපාධි ප්‍රධානෝත්සවයට අදාල පීඨයන්හි ලේඛකාධිකාරීවරුන් හා විශ්වවිද්‍යාලයේ විභාග අංශයට ලිඛිතව දැනුම් දෙනු ලබයි. ඒ අනුව අරමුදලින් කොපමණ ප්‍රමාණයක් වර්ෂය තුල උපයෝජනය කරනු ලබන්නේද යන්න තීරණය කිරීමේ බලය අදාල පීඨයන්ට ඇති බැවින් ඔවුන් විසින් තහවුරු කරනු ලබන මුදල් ප්‍රමාණය පමණක් ඒ ඒ අරමුදලින් උපයෝජනය කරනු ලබයි. | අරමුදල් පිහිටුවීමේ අරමුණු ඉටුකර ගැනීම සඳහා අරමුදල් උපයෝජනය කළ යුතුය. |
| (ඇ) 2021 දෙසැම්බර් 31 දිනට එකතුව රු.34,368,284 ක් වූ පර්යේෂණ අරමුදල් ගිණුම් 21 ක් වසර 06 කට වඩා වැඩි කාලයක සිටද, එකතුව රු.36,622,659 ක් වූ බාහිර පර්යේෂණ අරමුදල් 54 ක් හා එකතුව රු.562,099,625 ක් වූ විශේෂ අරමුදල් 37 ක් සමාලෝචිත වර්ෂය තුළ අදාළ අරමුණු වෙනුවෙන් උපයෝජනය කර නොතිබුණි. | අදාල පර්යේෂණ අරමුදල් නිශ්චිත අරමුණක් වෙනුවෙන් ලැබී ඇති අතර ඒ සඳහා උපයෝජනය කරනු ලබයි. ඒසේ වුවත් අක්‍රිය ශේෂයන් පවතින ශේෂයහි ප්‍රධානලාභීන් වෙත ලිපි මගින් දැනුවත්කර පොදු පර්යේෂණ අරමුදලකට යොමුකර ඇති අතර මෙම ක්‍රියාවලිය 2022 වසරේදීද ක්‍රියාත්මක වන අතර අක්‍රිය මුදල් උපයොජන කිරීමට කටයුතු කරනු ලබයි. විශේෂ අරමුදල් යටතේ පවතින මුදලද අදාල කාර්යයන් සඳහා පමණක් යෙදවිය හැකි අතර මෙම මුදල් 2022 වසරේ උපයෝජනය වෙමින් පවතී. | අරමුදල් පිහිටුවීමේ අරමුණු ඉටුකර ගැනීම සඳහා අරමුදල් උපයෝජනය කළ යුතුය. |

### 3.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) තාක්ෂණික නවෝත්පාදන හා ව්‍යාපාර ආධාරක මධ්‍යස්ථානය, ව්‍යවහාරික විද්‍යාපීඨ උද්භිත විද්‍යා අධ්‍යයනාංශයේ මහල් 3 ක ගොඩනැගිල්ල හා ව්‍යවහාරික විද්‍යා පීඨයේ මහල් 8 ක ගොඩනැගිල්ලේ 5 වන මහල යන ඉදිකිරීම් කොන්ත්‍රාත් 3 ට අදාළව 2021 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත් කාලය පිළිවෙලින් දින 344ක්, දින 659 ක් හා | රටේ පැවති කොරෝනා වසංගතය හමුවේ විටින් විට දෛනික රාජකාරී කටයුතු අක්‍රිය වීම, ගොඩනැගිලි ද්‍රව්‍ය හිඟවීම, ශ්‍රමය සපයා ගැනීමට නොහැකි වීම වැනි කරුණු සැලකිල්ලට ගෙන පාලක සභාව මඟින්ද අවස්ථා කීපයකදී කාල දීර්ඝ කිරීම් ලබා දී තිබුණි. මෙම ව්‍යාපෘති දැනට ක්‍රියාත්මක | ගොඩනැගිලි සැලසුම් අනුමත කර ගැනීමට හා කොන්ත්‍රාත් නියමිත දිනට නිම කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | දින 214 ක් ප්‍රමාදවී තිබුණද දීර්ඝ කිරීම සඳහා අනුමැතිය ලබා දී නොතිබුණි. කොන්ත්‍රාත් 3 හි අවසන් බිල්පත් ඉදිරිපත් කළ දිනට වැඩ නිම කළ ප්‍රතිශතය පිළිවෙලින් සියයට 65 ක්, සියයට 66 ක් හා සියයට 53 ක් විය. මෙම කොන්ත්‍රාත් 3 සඳහා වූ ගොඩනැගිලි සැලසුම් මහනගර සභාවෙන් අනුමත කර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර නාගරික සංවර්ධන අධිකාරියේ නිරවුල් සහතිකය ලබා ගැනීමටද කටයුතු කර නොතිබුණි. | වෙමින් පවතින අතර එම කොන්ත්‍රාත්කරු මඟින්ම මෙම කාර්යායන් අවසන් කර ගැනීම සඳහා කටයුතු කරමින් පවතී. | |
| (ආ) | මුළු පිරිවැය රු. මිලියන 363.5 ක් වූ ව්‍යවහාරික විද්‍යා පීඨයේ මහල් 8 ක ගොඩනැගිල්ල 2008 වර්ෂයේ සිට අදියර 3කින් ඉදිකිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇතත් පස්වන මහල වන විට කොන්ත්‍රාත්කරුවන් 4 දෙනෙකු වෙත කොන්ත්‍රාත් පිරිනමා තිබුණි. | අනුමැතිය ලැබී තිබුණද මුදල් ප්‍රතිපාදන වෙන් නොවීම හේතුවෙන් අරමුදල් ලැබීම් පදනම් කරගෙන පියවර වශයෙන් කොන්ත්‍රාත් ප්‍රදානය කර ඇත. මෙමගින් බලාපොරොත්තු වූයේ ප්‍රතිපාදන මත සාදානිමකල හැකි කොටස ඉදිකර එය ශිෂ්‍යයන්ගේ ප්‍රයෝජනයට ලබා දීමයි. | අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව කටයුතු කළ යුතුය. |